මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2022 මාර්තු මස 04 දින |

# මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 02-2022 මාර්තු

# ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කරයි

## ගෝලීය ආර්ථික වර්ධනය අඩු මට්ටමක පවතිනු ඇති අතර, ගෝලීය උද්ධමනය ඉහළ මට්ටමක පවතිනු ඇත

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි 2022 ජනවාරි වාර්තාවට අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේදී සියයට 5.9 සිට 2022 වසරේදී සියයට 4.4 දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 ඔමික්‍රෝන් ප්‍රභේදයේ ව්‍යාප්තිය, සැපයුම් දාම සඳහා බාධා වීම් සහ නැගෙනහිර යුරෝපයේ භූදේශපාලනික අර්බුද හේතුවෙන් ගෝලීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම දුර්වල වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ බලශක්ති මිල ගණන් සහ සැපයුම් දාම සඳහා අඛණ්ඩව බාධා වීම් හේතුවෙන් ගෝලීය උද්ධමනය ඉහළ මට්ටමක අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ගෝලීය වශයෙන් මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාර දැක්වීමට හේතු වනු ඇත.

## ගෝලීය සහ දේශීය ප්‍රවණතා ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම කෙරෙහි අභියෝග එල්ල කර ඇත

රජයේ සාර්ථක කොවිඩ්-19 එන්නත්කරණ වැඩපිළිවෙළ සහ ලිහිල් කරන ලද සංචරණ සීමා හේතුවෙන් දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සැපයුම් දාම සඳහා බාධා වීම් සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම වැනි ගෝලීය වශයෙන් මෑත කාලීනව ඇති වූ අයහපත් ප්‍රවණතා මෙන්ම, විශේෂයෙන් විදුලිය සහ සැපයුම් අවහිරතා වැනි දේශීය වශයෙන් සිදු වූ බාධා හේතුවෙන් ආර්ථික කටයුතු සඳහා යම් බලපෑමක් ඇති වී තිබේ. දේශීය නිෂ්පාදන සහ අපනයන වර්ධනය අවහිරතාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා මෙවැනි බාධාවන්ට කඩිනමින් පිළියම් යෙදිය යුතු අතර, මනා ලෙස ඉලක්කගත වර්ධන ප්‍රතිපත්ති හරහා නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමේ උත්සාහය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

## විදේශීය අංශය දැඩි අභියෝගවලට මුහුණ දෙමින් පවතී

2022 වසරේ ජනවාරි මාසයේදී අඛණ්ඩව අටවැනි මාසයටත් වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් එ.ජ. ඩොලර් බිලියනයකට වඩා වාර්තා වුවද, ආනයන වියදම් අඛණ්ඩව වැඩි වේගයකින් ඉහළ ගියේය. 2022 වසරේ මේ දක්වා කාලය තුළදී සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස වැඩි වුවද, මෑතකාලීන භූදේශපාලනික අර්බුද සංචාරක කර්මාන්තය කෙරෙහි යම්තාක් දුරකට බලපානු ඇත. මේ අතර, දිරිගැන්වීම් ක්‍රම හරහා විධිමත් මාර්ග තුළින් විදේශීය ප්‍රේෂණ දිරිමත් කරන

අතරම, නීති විරෝධී මුදල් හුවමාරු කිරීම් මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ රැකියා සඳහා විදේශගතවීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, ඉදිරි කාලය තුළදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා රුපියල සමස්තයක් ලෙස ස්ථාවරව පවත්වාගෙන යන ලද අතර, 2022 වසරේ ජනවාරි මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ. ජ. ඩොලර් බිලියන 2.4ක් ලෙස එනම් ආනයනික මාස 1.3කට සමාන බව තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. ඒ අතරම, දේශීය ආර්ථික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා පහසුකම් සලසන අතරම නව විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය සහ මහ බැංකුව දැඩි කැපවීමකින් ක්‍රියා කරමින් සිටියි.

## වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යමින් පවතී

දේශීය ණය, විශේෂයෙන්ම රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රසාරණය ඉහළ මට්ටමක පැවතුණි. එහෙත්, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන් පුළුල් මුදල් වර්ධනයේ ($M_{2b}$) යම් අඩුවීමක් දක්නට ලැබුණි. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන්, වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම අඩු ප්‍රමාණයකින් සිදු වන අතර, සංසරණයේ පවතින අතිරික්ත මුදල්වලින් බැංකු පද්ධතියට තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා එය ප්‍රමාණවත් නොවේ. එම නිසා, ඉතිරිකිරීම් දිරිමත් කිරීමට වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගැළපීම් සිදු කරන ලෙස බැංකු සහ මූල්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. මේ අතර, රජයේ ඉහළ මූල්‍යකරණ අවශ්‍යතා අනුව වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

## මිල පීඩන සඳහා සැපයුම් අංශයේ සාධක දායක වී ඇති අතර සමස්ත ඉල්ලුමෙහි වැඩි වීමක් ද දක්නට ලැබේ

සැපයුම් අංශයේ බාධා, ඉහළ යන ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් සහ ඒ අනුව සිදුවන දේශීය පරිපාලිත මිල ගැළපීම් මෙන්ම ආහාර සැපයුම් බාධා යනාදිය දේශීය වශයෙන් උද්ධමන පීඩන ඉහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. වසංගතය ආරම්භයේ සිට පැවති ලිහිල් මුදල් තත්ත්ව සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වූ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්ව ඉහළ යෑම, මූලික උද්ධමනයේ ඉහළ යෑම මගින් පිළිබිඹු කෙරේ. කෙටිකාලීනව උද්ධමන පීඩන ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර**,** උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහ මැදි කාලීනව උද්ධමනය නැවතත් අපේක්ෂිත මට්ටම් කරා ළඟා කර ගැනීම සඳහා සමස්ත ඉල්ලුම ඉහළ යෑම මගින් ඇති වන උද්ධමන පීඩන අවම කර ගැනීමේ පූර්වෝපායික ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

## ඉහළ සාර්ව ආර්ථික ස්ථායීතාවට සහාය වීම සඳහා ප්‍රතිපත්ති මාලාවක්

බාහිර කම්පනවල දැඩි බව සහ දේශීය ආර්ථික කටයුතු සඳහා අඛණ්ඩව බාධා ඇතිවීම් සැලකිල්ලට ගනිමින්, එවැනි ආර්ථික තත්ත්වයන්ට මුහුණ දීම සඳහා සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ක්‍රියාමාර්ග ඇතුළත් ප්‍රතිපත්ති මාලාවක් සහ සමස්ත ආර්ථිකයට බලපානු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය.

ඒ අනුව, ගෝලීය මෙන්ම දේශීය වශයෙන් පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා මනාව සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2022 මාර්තු මස 03 වැනි දින

පැවති රැස්වීමේදී 2022 ජනවාරි මාසයේදී ගන්නා ලද ස්ථාවරය තවදුරටත් අවධාරණය කොට පවත්වාගෙන යෑමට තීරණය කළ අතර පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 100 බැගින්, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 7.50 දක්වා ඉහළ නැංවීම**;**

(ආ) පොලී අනුපාතික මත පනවා ඇති උපරිම සීමා, එනම් ණය කාඩ්පත් මත උපරිම පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 20 දක්වා, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා මත උපරිම පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 18 දක්වා සහ උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 12 දක්වා ඉහළ නැංවීම. මෙම නියාමනය කරන ලද පොලී අනුපාතික ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග කඩිනමින් නිකුත් කරනු ඇත.

ඉහත ක්‍රියාමාර්ග මගින් ආර්ථිකයේ ඇතිවිය හැකි යටිදැරි ඉල්ලුම් පීඩන ගොඩනැගීම පාලනය කෙරෙනු ඇතැයි මුදල් මණ්ඩලයේ අදහස වූ අතර, එමගින් විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීමටද සහාය වෙමින් ඉහළ සාර්ව ආර්ථික ස්ථායීතාව ප්‍රවර්ධනය කරනු ඇත.

එමෙන්ම, වත්මන් ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා මහ බැංකුව ගෙන ඇති ක්‍රියාමාර්ගවලට සහාය වීමට රජය විසින් ඒකාබද්ධ ප්‍රයත්න කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව ඇත. එබැවින්, රජයේ ආර්ථික හා මූල්‍ය උපදේශක ලෙස, පහත සඳහන් කරුණු කඩිනමින් සලකා බලන ලෙස මහ බැංකුව රජයෙන් ඉල්ලා සිටියි.

අ) මහ බැංකුව විසින් පෙර සිදු කරන ලද නිර්දේශ මත පදනම්ව අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයන අධෛර්යවත් කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දීම

ආ) පිරිවැය පිළිබිඹු කිරීම සඳහා කඩිනමින් ඉන්ධන මිල සහ විදුලි ගාස්තු වැඩි කිරීම

ඇ) විදේශ ප්‍රේෂණ සහ ආයෝජන තවදුරටත් දිරිගැන්වීම

ඈ) පුනර්ජනනීය බලශක්ති කරා කඩිනමින් යොමු වන අතරම, බලශක්ති සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

ඉ) තිරසාර පදනමක් මත සුදුසු බදු වැඩිකිරීම් හරහා රජයේ ආදායම ඉහළ නැංවීම

ඊ) කඩිනමින් විදේශ මූල්‍යන සහ ණය නොවන විදේශ විනිමය ලබා ගැනීම

උ) උපායමාර්ගික නොවන සහ ඌන උපයෝගී වත්කම් කඩිනමින් අලෙවි කිරීම, සහ

ඌ) අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ප්‍රාග්ධන ව්‍යාපෘති කල් දැමීම.

ඉහත ක්‍රියාමාර්ග රට මුහුණදී සිටින අභියෝගාත්මක ආර්ථික තත්ත්වයෙන් මිදීම සඳහා සහ කොවිඩ් වසංගතය ආශ්‍රිතව ගනු ලැබූ ප්‍රතිපත්ති ලිහිල් කිරීම්වලින් විචක්ෂණශීලීව ඉවත් වීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව ගෝලීය මෙන්ම දේශීය වශයෙන් ඇතිවෙමින් පවතින සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා සමීපව නිරීක්ෂණය කරන අතරම, උද්ධමනය, විදේශීය අංශය සහ මූල්‍ය අංශයේ ස්ථායීතාව ළඟා කර ගැනීමේ අරමුණින් සහ එමගින් තිරසාර පදනමකින් මූර්ත ආර්ථික කටයුතු සඳහා සහාය වීමට සුදුසු පරිදි තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට සූදානම්ව සිටියි.

**මුදල් ප්‍රතිපත්ති තීරණය: ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවූ අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී**

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 6.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 7.50 |
| බැංකු අනුපාතිකය (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සමඟ ස්වයංක්‍රීයව ගලපන ලද) | සියයට 10.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 4.00 |

**නියාමනය කෙරෙන පොලී අනුපාතික නංවන ලදී:**

| | |
|---|---|
| ණය කාඩ්පත් මත උපරිම පොලී අනුපාතිකය | සියයට 20.00 |
| පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා මත උපරිම පොලී අනුපාතිකය | සියයට 18.00 |
| උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතිකය | සියයට 12.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් 2022 මාර්තු මස 04 වැනි දින ප.ව. 12.30ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2022 අප්‍රේල් මස 07 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | ජුලි 21 | අගෝ 21 | සැප් 21 | ඔක් 21 | නොවැ 21 | දෙසැ 21 | ජන 22 | පෙබ 22 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 5.7 | 6.0 | 5.7 | 7.6 | 9.9 | 12.1 | 14.2 | 15.1 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.8 | 6.7 | 6.2 | 8.3 | 11.1 | 14.0 | 16.8 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 3.7 | 4.1 | 5.0 | 6.3 | 7.0 | 8.3 | 9.9 | 10.9 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.4 | 4.7 | 4.8 | 7.2 | 8.8 | 10.8 | 12.9 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජුලි 21 | අගෝ 21 | සැප් 21 | ඔක් 21 | නොවැ 21 | දෙසැ 21 |
| සංචිත මුදල් | 1,031 | 1,036 | 1,065 | 1,064 | 1,089 | 1,296 | 1,286 | 1,288 | 1,306 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,947 | 10,033 | 10,165 | 10,304 | 10,514 | 10,488 | 10,582 | 10,546 | 10,647 |
| ශුද්ධ විදේශීය වත්කම් | (431) | (429) | (481) | (699) | (701) | (722) | (837) | (906) | (982) |
| ශුද්ධ දේශීය වත්කම් | 10,378 | 10,462 | 10,646 | 11,003 | 11,215 | 11,210 | 11,418 | 11,452 | 11,629 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 4,965 | 5,024 | 5,195 | 5,513 | 5,682 | 5,792 | 5,923 | 6,074 | 6,287 |
| රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය | 1,093 | 1,113 | 1,132 | 1,141 | 1,137 | 1,123 | 1,194 | 1,185 | 1,188 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,446 | 6,501 | 6,585 | 6,661 | 6,796 | 6,825 | 6,860 | 6,920 | 6,981 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 12,154 | 12,265 | 12,402 | 12,563 | 12,790 | 12,742 | 12,873 | 12,862 | 12,985 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2021 සැප් අවසානයට | 2021 ඔක් අවසානයට | 2021 නොවැ අවසානයට | 2021 දෙසැ අවසානයට | 2022 ජන අවසානයට | 2022 පෙබ අවසානයට | 2022 මාර් 03 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 5.00 | 5.00 | 5.00 | 5.00 | 5.50 | 5.50 | 5.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 6.00 | 6.00 | 6.00 | 6.00 | 6.50 | 6.50 | 6.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 5.94 | 5.93 | 5.92 | 5.95 | 6.48 | 6.48 | 6.49 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 6.70 | 8.43 | 7.53 | 8.16 | 8.63 | 8.61 | 9.33 (අ) |
| දින 182 | 6.99 | 8.16 | 8.02 | 8.33 | 8.55 | 8.53 | 9.88 (අ) |
| දින 364 | 7.01 | 8.18 | 8.16 | 8.24 | 8.55 | 8.53 | 9.95 (අ) |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 6.42 | 7.82 | 8.00 | 8.61 | 8.52 | 8.99 | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 9.37 | 9.49 | 9.79 | 9.87 | 10.12 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 8.14 | 8.78 | 9.18 | 9.48 | 9.76 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 4.75 | 4.79 | 4.82 | 4.94 | 5.01 | 5.07 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 5.64 | 5.70 | 5.75 | 5.94 | 6.05 | 6.15 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 5.53 | 5.96 | 6.27 | 6.45 | 6.58 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 5.69 | 6.19 | 6.52 | 6.67 | 6.79 | - | - |

(අ) 2022 වසරේ මාර්තු මස 02 වැනි දින පැවති වෙන්දේසියේ එලදා අනුපාතිකය

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*